දුරකථන
தொலைபேசி
Telephone
2329270 කොමසාරිස්
2326075
2329102
2348228

ෆැක්ස්
பெக்ஸ் இல.
Fax
2329270

විදුලි පණිවුඩ
தந்தி
Telegrams
සමුපකොම
கூட்டுறவாணை
CREDIT

මගේ අංකය
எனது இல.
My No.
සමු/මෙ/1/CCD/01

ඔබේ අංකය
உமது இல.
Your No.

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
# බස්නාහිර පළාත

තැ.ප.444, ආදිපාද වීදිය, කොළඹ 01.

கூட்டுறவு அபிவிருத்தித் திணைக்களம்
மேல் மாகாணம்,
தபாற் பெட்டி 444, டியூக் வீதி, கொழும்பு 01

DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT
WESTERN PROVINCE
P.O.Box.444, Duke Street, Colombo 01


2023.01. 23

දෙපාර්තමේන්තු චක්‍රලේඛ -03/2023

බස්නාහිර පළාතේ සියළුම ලියාපදිංචි සමුපකාර සමිතිවල හා සංගම්වල
ගරු සභාපති /ලේකම් /සාමාන්‍යාධිකාරි වෙත,

මහත්මයාණෙනි/ මහත්මියණි

**<u>පළාත් පාලන, පළාත් සභා, පාර්ලිමේන්තු ඡන්ද විමසීම් අවස්ථාවල අපේක්ෂකයෙකු ලෙස තරඟ කිරීම</u>**

ඉහත කී ඡන්ද විමසීම්වලදී ලියාපදිංචි සමුපකාර සමිතිවල හා සංගම්වල සභාපතිවරුන්, උපසභාපතිවරුන්, වෙනත් ප්‍රධාන තනතුරු දරන්නන් ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ඡන්ද අපේක්ෂකයින් වශයෙන් ඉදිරිපත් වේ. එවන් අවස්ථාවලදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව පහත සඳහන් නියමයන් අනුව කටයුතු කළ යුතු වේ. එනම්,

01. <u>නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කරනු ලබන සභාපතිවරුන්, උපසභාපතිවරුන්, වෙනත් ප්‍රධාන තනතුරු දරන්නන් ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩල /කාරක සභා සාමාජිකයින්,</u>

1.1. ඉහත ඡන්ද විමසීම්වලදී සභාපති, උපසභාපති හෝ වෙනත් ප්‍රධාන තනතුරක් දරන්නෙකු හෝ අධ්‍යක්ෂ මණ්ඩල / කාරක සභිකයෙකු අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වන්නේ නම් නාම යෝජනා පත්‍ර භාර දීමට සති 02 කට පෙර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලිඛිතව දැනුම් දිය යුතුය.එතකුදු වුවත් මෙම චක්‍රලේඛනය නිකුත් කරන අවස්ථාව වන විට නාම යෝජනා භාර දී ඇත්නම් අදාළ ඡන්ද විමසීමේ අපේක්ෂිකයකු ලෙස ඉදිරිපත් වී ඇති බව වහාම අදාළ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලිඛිතව දැන්විය යුතුය.

1.2. එම ලිඛිත දැන්වීම අනුව අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව විසින් එකී තැනැත්තා තනතුරට අදාළ නිල කටයුතු වලින් නිදහස් කිරීමට තීරණයක් ගෙන ඒ බව ලිඛිතව අපේක්ෂකයාට දැන්විය යුතුය.

1.3. ඉහත සඳහන් ලිඛිත දැන්වීමෙන් පසු සභාපති, උපසභාපති, වෙනත් ප්‍රධාන නිලයක් දරන්නෙකු හා අධ්‍යක්ෂක මණ්ඩල/කාරක සභාවේ සාමාජිකයෙකු සමිතියේ/සංගමයේ සියලුම නිල කටයුතුවලින් ඉවත්විය යුතුවේ.

1.4. යම් ලියාපදිංචි සමිතියක හෝ සංගමයක සභාපති, උපසභාපති, වෙනත් ප්‍රධාන නිලයක් දරන්නෙකු ඇතුලු අධ්‍යක්ෂක මණ්ඩලයේ/ කාරක සභාවේ අඩකට වැඩි ගණනක් ඡන්ද විමසීමක් සඳහා නාමයෝජනා පත්‍ර භාරදී ඇති අවස්ථාවල හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ/කාරක සභාවේ වැඩි පිරිසක් නාම යෝජනා පත්‍ර භාර දීම නිසා සමිතියක කටයුතු අඩාල වන අවස්ථාවක එම සමිතියේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීමට

ලේකම්වරයා විසින් බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත දැනුම් දිය යුතුය.

1.5. සභාපති, උපසභාපති හෝ වෙනත් ප්‍රධාන නිලධාරියෙකු ඉහත කී විධිවිධාන යටතේ සමිතියේ නිල කටයුතු වලින් වැළකී සිටින වකවානුව තුළ එකී නිල කටයුතු ආවරණය කිරීම සඳහා සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවට අනුකූලව තැනැත්තන් පත්කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කල යුතුය. එහෙත් එය නිත්‍ය තනතුරක් ලෙස හෝ පුරප්පාඩු තනතුරක් ලෙස නොසැලකිය යුතුය.

1.6. ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කර අපේක්ෂකයා තේරී පත්වී මන්ත්‍රීවරයෙකු වශයෙන් දිවුරුම් දීමත් සමඟ බස්නාහිර පළාතේ සමුපකාර සමිති ප්‍රඥප්තියේ විධිවිධාන අනුව සභාපති ධූරය, උපසභාපති ධූරය, වෙනත් ප්‍රධාන නිලයක්, අධ්‍යක්ෂක මණ්ඩලයේ/ කාරක සභාවේ සාමාජිකත්වය අහෝසි විය යුතුය.

1.7. ඡන්ද ප්‍රතිඵල අනුව තේරිපත් නොවුවහොත් හෝ තේරිපත් වුවද මන්ත්‍රී ධූරය භාරගැනීම ප්‍රතික්ෂේප කලහොත් හෝ සමුපකාර සමිතිය හෝ සංගමය තමා දැරූ නිලයට හෝ අධ්‍යක්ෂක මණ්ඩල/ කාරක සභා සාමාජික ධූරයට ආපසු පැමිණිය හැක. එකී තනතුරේ හෝ අධ්‍යක්ෂක මණ්ඩලයේ/ කාරක සභාවේ නිල කාලය තුල පමණක් ධූර දැරිය හැක. ඡන්ද විමසීම පැවැත්වීමට පෙර අධ්‍යක්ෂක මණ්ඩලයේ / කාරක සභාවේ නිල කාලය අවසන් වුවහොත් ධූරය අහෝසි වූවා සේ සැලකිය යුතුය.

02. <u>නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇති ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම් වල සේවකයින්</u>

2.1 යම් සමුපකාර සේවකයකු ඉහත කී ඡන්ද විමසීම් වලදී අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වන්නේ නම්, නාම යෝජනා ඉදිරිපත් කිරීමට පෙර හෝ මෙම චක්‍රලේඛනය නිකුත් කරන අවස්ථාව වන විට නාම යෝජනා භාර දී ඇත්නම් අදාල ඡන්ද විමසීමේ අපේක්ෂිකයකු ලෙස ඉදිරිපත් වී ඇති බව වහාම අදාළ සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලිඛිතව දැන්විය යුතුය.

2.2 එම ලිපියට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහු සමිතියේ සේවා කටයුතු වලින් තාවකාලිකව නිදහස් කර නිවාඩු අනුමත කල යුතුය. නාම යෝජනා පත්‍ර භාර දුන් දිනයේ සිට ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර ගැසට් පත්‍රයේ පල කරනු ලබන කාල සීමාව ඇතුලත සමිතියේ කිසිදු කාර්යයක නොයෙදිය යුතුය. නිවාඩු අනුමත කිරීමේ දී අදාල වර්ෂය තුල සේවකයන්ට ලබා ගත හැකි සාමාන්‍ය නිවාඩු වලින් එම නිවාඩු ලබා දිය යුතු අතර එකී නිවාඩු ප්‍රමාණවත් නොවන විට ඉතිරි කාලයට වැටුප් රහිත නිවාඩු අනුමත කල යුතුය.

2.3 සේවකයා සේවා කටයුතු වල නොයෙදෙන කාල සීමාව තුල සේවකයාට පවරා තිබූ කාර්යයන් ආවරණය කිරීම සඳහා සමිති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර විධිවිධාන යොදා ගත යුතු අතර මෙය පුරප්පාඩුවක් ලෙස නොසැලකිය යුතුය.

2.4 ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් පසු පළාත් පාලන මැතිවරණයක දී සේවකයාට නැවත තම තනතුරට වාර්තා කල හැක.එහෙත් පළාත් පාලන ආයතනයේ රැස්වීමට සහභාගී වීම සඳහා රාජකාරී නිවාඩු ලබා දිය යුතුය.පළාත් සභාවකට පත් වී ඇතිනම් එම ධූර කාලයට අදාලව වැටුප් රහිත නිවාඩු ලබා දිය යුතුය. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වී ඇත්නම් සමුපකාර සමිතියේ හෝ සංගමයේ තනතුරෙන් ඉල්ලා අස්විය යුතුය.

03. මෙම චක්‍රලේඛනයේ අවස්ථානුකූලව ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග වචන යොදා ගත යුතුය.

04. මෙම විෂය ක්ෂේත්‍රයට අදාලව මීට පෙර නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ අවලංගු වේ.

**රුවිනි.ජ.විජයවික්‍රම**
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බස්නාහිර පළාත